පුවත් පතින්

92-11-27


# තුරුලිය වවා ලක්මව සනසන්න!

අනුරාධපුරයේ මහමෙවුනා උයන, රත්මසු උයන හා සීගිරි උයන වැනි රාජකීය උයන් බිහිකරන ලද අපේ මුතුන්මිත්තන්ගේ මාහැඟි උද්‍යාණ නිර්මාණ ශිල්පීය දක්කම් සිහිපත් කරමින් වත්මන් ශ්‍රී ලංකාවේ පරිසරය අලංකාර කිරීම සහ ශාරීරික හා මානසික සුවය සඳහා අපගේ නගර හා ගම් දනව් වල තුරුලිය සිටුවීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළක් දියත් කිරීමට කාලය උදාවී තිබේ.

නිවර්තන කලාපීය රටක්වන ශ්‍රී ලංකාවේ ජනයා හට බොහෝ වීට තද හිරු රැසින් පීඩා විඳීමට සිදු වේ. කොළඹ ඇතුළු අපගේ නගරවල සිටුවා ඇති ගස්ප්‍රමාණය මේ සඳහා කොහෙත්ම ප්‍රමාණවත් නොවේ. ගස්වලින් තොර නගරයක සැරිසැරීම අතිශයින් වීඩාව ගෙන දෙන්නකි. දූවිලි හා වාහන විෂ දුම් ආග්‍රාහණයෙන් ශරීරය අප්‍රාණික වේ. සෙවන ඇතිකරන ගස් දෙපසින් සිටුවා ඇති මාර්ගයක ගමන් කරන්නෙකු මෙවැනි ශාරීරික හා මානසික පීඩාවකට ලක් නොවේ. කොළඹ බෞද්ධාලෝක මාවත මෙයට ඇති කදිම උදහරණයකි.

## ශබ්දය උරාගනී

මහා මාර්ගයක දෙපස ඇති ගස් මගින් සෙවනට අමතරව රථවාහන මගින් ඇති කරන ශබ්ද පාලනයක්ද සිදු වේ. ගස්වල කඳ හා අතුපතර මගින් ශබ්දය උරා ගනී. මාර්ගය දෙපස සෙවන ගස් පේළි දෙකක් සිටුවා ඒ අතර මීටර් 3 පමණ උසට වැඩෙන පඳුරු ආකාරයේ ගස් පේළි කීපයක් සිටුවීම මගින් මාර්ගය දෙපස නිවෙස්වල ජීවත් වන්නවුන් හට රථ වාහන වලින් නැගෙන ශබ්දය කරදරකාරී නොවන මට්ටමකින් පාලනය කරගත හැකි වේ.

නිරතුරුව වාහන ගමන් කරන මාර්ග හෝ ගුරු පාරකින් නැගෙන දූවිලි එකී මාර්ග දෙපස සිටුවා ඇති ගස්වල පත්‍ර කරා ඇද ගැනීමේ හැකියාවක් තිබේ. අක්කර 2.5 ප්‍රමාණයක සිටුවා ඇති තුරුලිය ගොමුවකට වසරකට දූවිලි ඝන අඩි 4 පමණ උරාගත හැකි බව පරීක්ෂණ වලින් පෙනී ගොස් තිබේ.

## වාතය පිරිසිදු කරයි

පරිසරයේ තිබෙන අංගාරිකාම්ල වායුව (කාබන්ඩයොක්සයිඩ්) ශාඛ පත්‍රවලින් උරාගන සත්ව සංහතියේ ජීවනාලිය බඳු ජීවාත්නක වායුව (ඔක්සිජන්) මිහිතලයට ලබාදීම ශාක මගින් ඉටුවන තවත් අසිරිමත් කටයුත්තකි. මීටර් 25 උසැති මීටර් 15 පළලට විහිදී ඇති අතුපතර සහිත ශාකයකින් දිනකට අංගාරිකාම්ල වායුව ග්‍රෑම් 2400 වායු ගෝලයෙන් ඉවත් කරයි. මෙම ප්‍රමාණය නිවෙස් දහයක සිටින්නවුන් ගෙන් පිටවන අංගාරිකාම්ල වායු ප්‍රමාණයට සමානය. එසේම එවැනි ශාකයකින් දිනකට අම්ලකර ග්‍රෑම් 1712 පරිසරයට ලබා දේ. නගරයක වෙසෙන මිනිසෙකුගේ වාර්ෂික අම්ලකර අවශ්‍යතාවය සපුරාලීම සඳහා වර්ග මීටර් 30 – 40 විශාලත්වයක් ඇති තුරු ගොමුවක් අවශ්‍ය වේ. එනිසා මෙවැනි එක් විශාල ගසක් කපා දැමීම මගින් පීඩාවට පත්විය හැකි ඔබ හා අප වැන්නවුන්ගේ සංඛ්‍යාව කෙතරම්ද යන්න මඳකට සිතා බලන්න.


හෙන්රි රාජපක්ෂ
රාජකීය උද්භිද උද්‍යානය
පේරාදෙණිය.


## සිසිල ඇතිකරයි

ශාක උත්ස්වේදනය මගින් සැලකිය යුතු තරම් ජල වාෂ්ප ප්‍රමාණයක් වාතයට පිට කරයි. පාර දෙපස වැඩී ඇති විශාල මාර ගසක් තරම් ගසකින් දිනකට ජලය ගැලුම් 75 – 100 පරිසරයට නිකුත් වේ. මෙම ජල වාෂ්ප ඝනීභවනය වීමෙන් ඒ අවට විශාල ප්‍රදේශයක් සිසිල්වන අතර. වායු ගෝලයද පිරිසිදු වේ. තුරුලිය නොමැති පරිසරය දූවිලි හා රශ්මියෙන් යුත් කාන්තාරයක් බඳුය.


පළල් මහා මාර්ග හා අධිවේගී මහා මර්ගවල මැද තීරුවෙහි මී. 1.5 පමණ උසැති පඳුරු ආකාරයේ ගස් සිටුවීමෙන් රාත්‍රී කාලයේදී රථවාහන වල දීප්තිමත් ආලෝකය වැදී ඇස් නීලංකාරවීම වළකී. මෙය රිය අනතුරු වළක්වා ගැනීමට මහෝපකාරී වේ. මෙය බොහෝ දියුණු රටවල අනුගමනය කරනු ලබන කටයුත්තකි.

## සෝදපාළුව වලකයි

තණකොළ වැවී ඇති පසක්, සෝද පාළුවට ලක් නොවේ. කොළඹ නුවර මහා මාර්ගය ගැන මදක් විමසිලිමත් වන්න. පාර දෙපස තණ පිඩැලි නොමැති ස්ථාන විශාල වශයෙන් සෝද පාළුවට ගොදුරු වී ඇත. මාර්ගය දෙපස ඇති ගැට්ට පසින් පුරවා පිඩලි ඇල්ලීමෙන් පස සෝදායාම මෙන්ම පාපැදි යතුරු පැදි ආදිය අනතුරුට ලක්වීමද වළක්වාගත හැකිය.

කෙසේ වුවත් මාර්ගය දෙපස තණකොළ වවා එය මසකට පමණ වරක් කපා මැනවින් නඩත්තු කළ යුතුය. එවිට ජනයා පාරේ ගමන් නොකර පාර දෙපසින් ගමන් කිරීමට පෙළඹෙනු ඇත. මෙවිට වටිනා ජීවිත හානි වීම වළක්වා ගත හැකිය.

අතුපතර විහිදී ඇති ශාක මත ඇද හැලෙන වර්ෂා ජලයේ වේගය අඩුවී පොළවට පතිත වන්නේ එය පස සංරක්ෂණය සඳහා මහත් උපකාරයකි. තද සුළං මගින් නිවෙස් හාවෙනත් දේපලවලට මහත් ආපද පැමිණේ. කඳුකර ප්‍රදේශවල හා සුළං මුහුනත්වල සුළං බාධක ලෙස ශක්තිමත්ව උසට



වැඩෙන ශාක සිටුවීම මෙයට ලබා දිය හැකි පහසුම විසඳුමයි. මෙම සුළං බාධක මගින් පාංශු සංරක්ෂණයටද අනුබලයක් ලැබේ.

සිරිලක ධරනීතලය පුරා විවිධ දේශගුණික කලාපයන්හි ස්වාභාවිකව වැඩෙන විවිධ ශාක වර්ග ජාතික වස්තූන් වැනිය. ඒනිසා මෙකී ප්‍රදේශයන්හි විවිධ ස්ථානවල සිටුවීමට යෝග්‍ය ශාක වර්ග තෝරාගැනීම දුෂ්කර නොවේ. ගස් සිටුවීමේ මහා පුන්‍යකර්මයට, පැල සැපයීමෙන් හා අවශ්‍ය උපදෙස් ලබාදීමෙන් සම්මාදම් වීමට සැදි පැහැදි සිටින රජයේ හා රජයේ නොවන ආයතන හා සංවිධාන රාශියකි. එසේ නම් අප විසින් කළ යුත්තේ වසරේ සුදුසු කාල වලදී ශාක සිටුවීමට පියවර ගැනීමයි. එසේම සිටුවනු ලබන ශාක ක්‍රමවත්ව නඩත්තු කර වර්ධනය වනතෙක් රැක බලා ගැනීමේ වගකීමද අපගේ කාර්යභාරයේ කොටසක් ලෙස සැමදෙනා විසින් අවබෝධ කරගත යුතුය. තුරුලිය රෝපණය කිරීමේදී සැලකිල්ලට ගතයුතු කරුණු කීපයකි.

## නගරයට ගැලපෙන ශාක

නගර හෝ මහමාර්ග අවට සිටුවීමට තෝරා ගතයුත්තේ එම ප්‍රදේශයේ දේශගුණයට ඔරොත්තු දෙන ශාක වර්ග වේ. එකී ශාකවල සුළඟට කඩා නොවැටෙන ශක්තිමත් අතු තිබිය යුතුය. මහා මාර්ගවල දිවෙන රථවාහන වල විෂ දුම් වලට ඔරොත්තු දීමේ හැකියාවක් තිබිය යුතුය. ශාක මුල් පොළව මතු පිටට පැමිණ වැඩෙන වර්ග නොවිය යුතුය. නිරතුරුව ගෙඩි සැදෙන ශාක වර්ග මාර්ග දෙපස රෝපනයට නුසුදුසුය. වැඩිපුර දූවිලි හා ශබ්දය පාලනය කරගැනීමට එම ශාකවල පත්‍ර කුඩා විය යුතුය. කුඩා පත්‍ර සහිත ශාකයකින් මනස නැත්පත්වන ස්වභාවයක්ද විශාල පත්‍ර සහිත ශාකයකින් මනසට කැලඹිලි සහිත බවක්ද ඇති වේ.

සිටුවීමට යොද ගන්නා පැලය මීටරයක් පමණ විශාල වීම වඩා යෝග්‍යය. කුඩා පැල රැකබලා ගැනීම දුෂ්කරය. එසේම කටුක දේශගුණික තත්ව වලට ඔරොත්තුදීමේ හැකියාවද අඩුය. පැල සිටුවීමේදී එය සමඟ ඇති පොලිතීන් උරය ප්‍රවේශමෙන් ඉවත් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. මුල් විහිදී ඇති පස් බෝලය සමඟ ප්‍රවේශමෙන් සිටුවීමෙන් සිටුවන පැල වලින් විශාල ප්‍රමාණයක් නොමැරී ආරක්ෂා කරගත හැකිවේ.

විශාල ගස් වර්ගයන්හි පැල සිටුවීමට විශ්කම්භය හා ගැඹුර මීටරයක් පමණ වන රවුම් හැඩැති වලවල්ද පඳුරු ආකාරයේ ගස් වර්ග සඳහා සෙ.මී.30 – 60 පමණ ගැඹුරැති වලවල්ද සකසා ගන්න. මතුපිට පස් හා දිරාපත්වූ ගොම පොහොර සම ප්‍රමාණවලින්ගෙන මිශ්‍රකර එම මිශ්‍රණයට සුපර් පොස්පේට් හා මියුරියේට් ඔෆ් පොටෑස් ග්‍රෑම 200 – 300 බැගින් මිශ්‍ර කර වල පුරවන්න. පොලිතීනය ඉවත් කළ පැලය බඳුනේ පස් සමග වලෙහිමැද සිටුවා හොඳින් පස් දමා තද කරන්න.

පැලය සෘජුව තබාගැනීමට එය සවිමත් ආධාරක ලීයකට තබා බඳින්න. ආධාරකයේ පොළව මතුපිටින් ඇති කොටසේ උස පැලයේඋසින් 1/3 විය යුතුය. පැල ආරක්ෂාකර ගැනීමට ලී, කම්බි දැල් හෝ වෙනත් ලෝහමය ද්‍රව්‍යකින් තනන ලද ආවරණයක් පැලය වටා සකස් කරන්න. මහා මාර්ග දෙපස සෙවන ගස් සිටුවීමේදී මාර්ගයේ ගැට්ටේ සිට මීටර් 3 දුරින් සිටුවන්න. විශාල ශාක වර්ග එකිනෙකට මීටර් 10 – 15 දුරින්ද ඇහැල පිහිඹිය වැනි මධ්‍යස්ථ විශාලත්වයක් සහිත ශාක මීටර් 8 පරතරයකින්ද සිටුවිය යුතුය. ඉඩකඩ තිබෙන ස්ථානවල ගස්පේලි දෙකක් සිටුවීම කළ හැකිය. මෙම ගස් අතර මීටර් 3 පමණ උසකට වර්ධනය වන පඳුරු වර්ග ආදිය සිටුවීමෙන් දූවිලි ශබ්දය මගින් වන බාධා මඟ හරවා ගත හැකිය. එකම වර්ගයකට අයත් ගස් මාර්ගය දෙපස සැහෙන දුරක් දක්වා සිටුවීම අංලකාරය වැඩි කරගැනීමට හේතුවකි.

කොන්ක්‍රීට් යොදා පදික වේදිකා සාදා ඇති මාර්ග දෙපස නියමිත පරතරයට සිටින සේ සිදුරු සහිත කොන්ක්‍රීට් බඳුන්වල පැල රෝපනය කළ හැකිය. කොළඹ නගරයේ වීදි දෙපසට මෙය යෝග්‍ය වේ. විදුලි රැහැන් සමග ශාක ගැටීම වළකාලීම සඳහා විදුලිබල මණ්ඩලයේ සහාය ඇතිව විදුලි රැහැන් පී.වී.සී. බට යොදා ආවරණය කිරීමට පියවර ගැනීමද වැදගත්ය.

ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග දෙපස ශාක ගොමු ආකාරයට රෝපනය කළ හැකිය. මෙමගින් වඩා ස්වාභාවික බවක් ඇතිකරගත හැකිය. ශාක වර්දනය වන්ම පොලව මට්ටමේ සිට මීටර් 4 දක්වා ඇති අතු කපා දමන්න. එවිට වාහන ගමනාගමනයට බාධා ඇති නොවේ.

දෙකට බෙදා ඇති මහා මර්ගවල මැද තීරුවෙහි පැල සිටුවීම විශේෂයෙන් කල්පනාකාරීව කළ යුත්තකි. මෙම තීරුවෙහි පළල අවම වශයෙන් මීටරයකට වැඩිවීම අත්‍යාවශ්‍යය. මීටරයකට වඩා පළල් තීරුවල මීටර් 1.5 වඩා උස නොයන පැල වර්ග රෝපනය කළ හැකිය. මෙම ශාකවල පත්‍ර කුඩා වීම වඩා සුදුසුය. මෙවැනි පළලින්අඩු තීරුවලට බෝගන්විලියා වැනි කටු සහිත පඳුරු වර්ග නුසුදුසුය. එවැනි පැල මීටර් 2 වැඩි පළලක් ඇති තීරු සඳහා සුදුසුය. බෝගන්විලියා සිටුවීමෙන් පසු මසකට වරක් දිය රිකිලි ඉවත් කරන්න. මෙවිට පඳුර අනවශ්‍ය ලෙස විශාලවීම වළකී. වැඩිපුර මල් හට ගනී. "යූ" ආකාරයට වාහන හරවන ස්ථානවල මැද තීරුවෙහි දෙපසට මීටර් 7 ක දුරක් දක්වා කිසිදු පැලයක් සිටුවීමට සුදුසු නැත. එම ඉඩම ප්‍රමණයෙහි තෘණ වගා කර නඩත්තු කළ යුතුය.

## වටරවුම් සඳහා

මහාමාර්ග සන්ධි වන ස්ථානවල ඇති වට රවුමවල පැල සිටුවීමෙදී සැලකිල්ලට ගතයුතු කරුණු රාශියකි. වට රවුම්වල පැල සිටුවීමේ රටාව සංකීර්ණ නොවිය යුතුය. විශාල ගස් හෝ උල් සහිත පත්‍ර ඇති ඝණ වැනි ගස්සිටුවීම නුසුදුසුය. විශාල ගස් මගින් දර්ශණපථය වැසී යයි. වට රවුමේ සිටුවන පැල අඩි 2 වඩා උස නොයන වර්ග විය යුතුය. කුඩා පඳුරු වර්ග සිටුවා, වැඩිපුර තෘණ වවා ඇති පසුබිම දිස්වීමට සැලැස්වීම අලංකාරය මෙන්ම ප්‍රවේශම් සහිත බවද වැඩි කරලීමට හේතු වේ. මුහුදු අසල ඇති වටරවුම්වල ඒ සඳහා ඔරොත්තු දෙන පැලෑටි පමණක් සිටුවිය යුතුය. අධික මුහුදු සුළං හමන ස්ථානවල බර්මියුඩා හෝ ඩිජ්ටේරියා ලොන්ගිප්ලෝරා වැනි තෘණ වර්ග පමණක් සිටුවීම සුදුසුය. මහා මර්ග අවට තුරුළිය සිටුවීමට පෙර මාර්ග සංවර්ධන අධිකාරියේ අවසරය ලබා ගැනීමට කටයුතු කළයුතුය.

මහා මර්ග අවට මෙන්ම නගරය තුළ ඇති සියළු හිස් බිම්වල ශාක සිටුවීම අනිවාර්ය කළ යුතුය. එසේම මෙවැනි ස්ථාන තෘණ පිට්ටනි ලෙස පවත්වා ගත හැකිය. මෙලෙස උයන් ආකාරයට සකස් කළ විට ජනයාට විධාව සංසිඳුවා ගැනීම සඳහා උද්‍යාන ආසන ආදිය ඒවායේ සවි කිරීමට පිළිවන.

## පැල රැකබලාගැනීමේ වගකීම ?

නගර තුළ මෙන්ම නගර යා කරන මහා මාර්ග දෙපසද ශාක සිටුවීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් දියත් කළ හැකිය. අදාල පළාත් පාලන ආයතන මගින් අවශ්‍ය නීති සම්පාදනය කළ හැකිය. මාර්ග දෙපස ඇති කඩ සාප්පු හා නිවාස වලට ඒ අසල සිටුවා ඇති ගස්වල නඩත්තුව භාරදිය හැකිය. නිවාස නොමැති ස්ථානවල ශාක නඩත්තුව අදාල පළාත් පාලන ආයතන මගින් ඉටු කළ යුතුය. සියළුම රාජ්‍ය ආයතන, කම්හල්, රෝහල් හා පාසැල් භූමි වල ප්‍රයෝජනවත් සුදුසු ගස් සිටුවීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් සංවිධානය විය යුතුය. රූපවාහිනිය, ගුවන් විදුලිය වැනි මාධ්‍යයන්ගෙන් ගස් සිටුවීමේ වැදගත්කම හා නඩත්තුව පිළිබඳ වැඩ සටහන් අඛණ්ඩව ප්‍රචාරය කළ යුතුය. ජනාවාස හා වෙනත් සංවර්ධන කටයුතු සඳහා භූමිය යොදා ගැනීමේදී ස්වාභාවික වෘක්ෂලතාදිය විනාශවීම නොවැළැක්විය හැකිය. මෙම අඩුව පිරිමසා ගැනීම සඳහා ගතහැකි ඉතාම ප්‍රායෝගික පියවර වන්නේ දිවයිනේ දසදෙස විහිදී ඇති මංමාවත් දෙපස රුක් රෝපනය කිරීමයි. සියළුම මුඩු ඉඩම් වල ප්‍රයෝජනවත් ගස් වර්ග සිටුවීම වැදගත්ය. පළතුරු, දව හා ඖෂධීය වටිනාකමක් සහිත ශාක කෙරෙහි මෙහිදී ප්‍රමුඛත්වයක් හිමිවිය යුතුය.



දියුණු රටවල මෙන් ගස්වැල් පිළිබඳ මනා අවබෝධයක් හා හැඟීමක් පාසැල් සිසුන් තුළ ඇතිකර ඔවුන් රුක් රෝපන කටයුතු වල නිරත කරවා ගත යුතුය. එවිට ඔවුන් වැඩිහිටියන්වූ දිනක ගස්වැල් රැකගැනීම කෙරෙහි ප්‍රමාණවත් උනන්දුවක් දක්වනු ඇත.

## සුදුසු ශාක වර්ග හඳුනාගන්න

රටේ විවිධ දේශගුණික කලාපවලට ගැලපෙන ශාක වර්ග, බීජ හෝ අතු මගින් බෝකර පොලිතීන් මළුවල සිටුවා මීටරයක් පමණ වැඩුණු පසු ස්ථිර භූමියේ සිටුවීමට කටයුතු සංවිධානය කළ යුතුය.

නුවරඑළිය වැනි කඳුකර ප්‍රදේශ සඳහා කීන, මිහිරිය, රතු මිහිරිය, නික දවුල, වල් සපු, කටුකෙන්ද, වැලිදඹ, අළු බෝඹු, රෝඩොඩෙන්ඩ්‍රන් වැනි ශාක සිටුවීමට යෝග්‍ය වේ.

පහතරට තෙත් කලාපයට යෝග්‍යවන්නේ මදවිය, මූදිල්ල, රුක් අත්තන, දෙඹ, දවට, ඇහැල, වෙල් කදුරු, මල්මාරා, පිහිඹිය, මූරුත (තෙතමනය සහිත ස්ථානවල) හික්, කොබෝලීල, මැහෝගනී, මී, නා, මූනමල්, තෙල්ලි, අරුළු, බුලු අශෝකා, ඕවිල, ගම්මාළු, තුඩෙල්ල, සියඹලා, ගම්සූරිය, කොට්ටම්බා ආදියයි.

කොහොඹ, ඇහැල, රතුවා, තේක්ක, මූරුත, කස, මල්මාර, හික්, මී, මූනමල්, ගස්කැල, මයිල . කිනිහිරිය, පාකින්සෝනියා, කෝන්, සියඹලා, ඕවිල, සුදු අරලිය, ගන්සූරිය ආදිය වියළි කලාපයට සුදුසුය.

මුහුදුබඩ ප්‍රදේශවල සිටුවීම සඳහා මූදිල්ල, කස, මදවිය, සුදු අරලිය, ඇහැල, කෝකෝවටං, දෙඹ, මූදු කදුරු, පෙල්ටෆෝරම්, මල්මාරා, වරා, ගන්සූරිය , සියඹලා, වැටකෙයියා, වෙල් කදුරු ආදිය සුදුසුය. වාරකන් සමයේදී පත්‍ර දුර්වර්ණ වුවද සුළං කාලය අවසානයේදී නැවත මෙම ශාක යථා තත්ත්වයට පත්වේ.

සුවඳැති මල් හට ගන්නා පඳුරු හා ශාබ වර්ග පූජනීය ස්ථාන, රෝහල්, පාසැල්, නිවාස අසල සිටුවීමෙන් පරිසරය සුවඳවත් වේ. සමන් පිච්ච, ගැට පිච්ච, සේපාලිකා, ගාඩිනියා, බෝල ඉද්ද, රැ කුමාරි, අරලිය වර්ග, කනේරු ඇටටෙරිය, වනසපු ආදිය මේ සඳහා යොදා ගත හැකිය.

ගස් සිටුවීමට ඉඩ නොමැති නගරවල ඇතැම් වීදි දෙපස ගඩොලින් 2 1/2 පමණ රවුම් බඳුන් සාද මල් හා අලංකාර පත්‍ර ඇති කනේරු, වද, බෝල ඉද්ද, ඇටටෙරියා, ටැකෝමා, රත්මල් වර්ග හා ක්‍රෝටන් වර්ග සිටුවිය හැකිය.

අප දිවයිනේ විවිධ දේශගුණයනට ගැලපෙන පරිදි ක්‍රමවත්ව තුරුලිය සිටුවීමේ වැඩ පිළිවෙලක් දියත් කළහොත් වසර දහයක් පමණ වනවිට ඉතා සුන්දර පරිසරයක් අප ජීවත්වන වටපිටාව තුළ ගොඩ නගා ගැනීමට හැකිවනු ඇත. මෙවන් පරිසරයක ජීවත් වන්නවුන් ඊර්ෂ්‍යා ක්‍රෝධ, මාන දුරලා සාමකාමී චිත්තයගරුක පිරිසක් බවට පත් කිරීමට එම සුන්දර වටපිටාව නිහඬ මෙහෙවරක යෙදෙනු නොඅනුමානය.